www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*සසප/ලෝසවෙඅ ගිම්හාන පාසල 2005*

# පලමු වැනි දේශනය: රුසියානු විප්ලවය සහ විසිවන සියවසේ නොවිසඳුනු ඓතිහාසික ගැටලු

*සිව්වන කොටස*

**Lecture one: The Russian Revolution and the unresolved historical problems of the 20th century -- Part 4**

**ඩේවිඩ් නෝත් විසිනි**

**2005 සැප්තැම්බර් 01**

*2005 අගෝස්තු මස 14 වැනි දා සිට 20 වැනි දා දක්වා මිචිගන්හි ඈන් ආර්බර්හි දී පැවැත්වුනු සමාජවාදී සමානතා පක්ෂයේ/ලෝසවෙඅ ගිම්හාන පාසැලෙහි දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩල සභාපති ඩේවිඩ් නෝත් විසින් පවත්වනු ලැබූ "රුසියානු විප්ලවය සහ විසිවන සියවසේ නොවිසඳුනු ඓතිහාසික ගැටලු" යන දේශනයේ සිව්වන හා අවසාන කොටස යි මේ. මෙය පාසැලෙහි පැවැත්වුනු පලමුවන දේශනය යි.*

## මාක්ස්වාදය අසාර්ථක වී ද?

සෝවියට් සංගමය බිඳ විසුරුවීම කම්කරු පන්තිය ලැබූ මූලික පරාජයක් සනිටුහන් කල බව ප්‍රතික්ෂේප කිරීමට ජාත්‍යන්තර කමිටුව කිසිවිටෙකත් උත්සාහ කර නැත. දශක ගනනාවක ස්ටැලින්වාදී පාවාදීම්වල ප්‍රතිපලය වූ එම කාරනය සමාජවාදී ඉදිරි දර්ශනය හෝ මාක්ස්වාදී ක්‍රමවේදය අවලංගු නො කරයි. සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය (සෝසසසං) බිඳ වැටීම තුලින්, මෙයින් කවරක් හෝ ඇඟවුම් නො කරයි. ස්ටැලින්වාදී නිලධරයේ මාක්ස්වාදී විරුද්ධ පාර්ශ්වය, 1923, වාම විරුද්ධ පක්ෂය පිහිටුවීමත් සමග මතු වී ආවේ ය. සෝවියට් සංගමය තුල දේශපාලන විප්ලවයක් කැඳවුම් කිරීමත් සමග එක්ව හතරවැනි ජාත්‍යනතරය පිහිටුවීමට ට්‍රොට්ස්කි ගත් තීරනය පදනම් වූයේ, ඔක්තෝබර් විප්ලවයේ සමාජ ජයග්‍රහන ආරක්ෂා කිරීම හා කම්කරු රාජ්‍යයක් ලෙස සෝසසසං පැවැත්ම තවදුරටත් රඳා පවත්නේ නිලධරය ප්‍රචන්ඩ ලෙස පෙරලා දැමීමෙන් ය යන ඔහුගේ නිගමනය මත ය.

1953 දී ජාත්‍යන්තර කමිටුව බිහි වූයේ, ස්ටැලින්ගේ මරනයෙන් පසු අවධියේ දී, සෝවියට් නිලධරය මාක්ස්වාදය හා බොල්ෂෙවික්වාදය කරා අනුක්‍රමිකව යලි පැමිනෙන දේශපාලන ස්වයං ප්‍රතිසංස්කරන ක්‍රියාවලියක් තුලින් ගමන් කරමින් සිටින නිසා දේශපාලන විප්ලවයක් සඳහා ට්‍රොට්ස්කිගේ කැඳවුම අවලංගු වී ඇතැයි තර්ක කල අර්නස්ට් මැන්ඩෙල් හා මයිකල් පැබ්ලෝ විසින් මෙහෙයවූ ප්‍රවනතාවකට එරෙහිව හතර වන ජාත්‍යන්තරය තුල ගෙන ගිය අරගලයකින් පසුව ය.

මාක්ස්වාදී ක්‍රමය මත පදනම්ව ස්ටැලින්වාදය විශ්ලේෂනය කිරීමේ දේශපාලනික බුද්ධිමත් භාවය ගැන හතර වන ජාත්‍යන්තරයේ හා ජාත්‍යන්තර කොමිටියේ පූර්න ඉතිහාසය ම දෙස් දෙයි. ස්ටැලින්වාදී නිලධරයේ අපරාධ හා පාවාදීම් මගින් මාක්ස්වාදය ප්‍රතික්ෂේප වී ඇත්තේ කුමන ආකාරයකින් කෙසේ දැයි කිසිවෙකුත් අපට පෙන්වා දී නැත.

උගත් වාම සහෝදරත්වයේ එක් නියෝජිතයෙකු විසින් අපට පවසා ඇත්තේ "දේශපාලන බලවේගයක් ලෙස සංවිධිත කොමියුනිස්ට්වාදයේ බිඳවැටීම ද, සමාජ ආකෘතියක් ලෙස රාජ්‍ය සමාජවාදයේ විනාශය ද, මාක්ස්වාදයේ බුද්ධිමය විශ්වාසනීයත්වය සමග සම්බන්ධ නැතැයි තර්ක කිරීම, ඊස්රායල් සොහොන් බිමකින් ක්‍රිස්තුස්ගේ ඇටකටු සොයා ගෙන තිබීම ද, පාප්වරයා නිලයෙන් ඉවත්වීම ද, ක්‍රිස්තියානි ලෝකය නිමාවට පත් වීම ද, ක්‍රිස්තියානි දේවධර්මවාදයේ බුද්ධිමය බැඳීම් සම්බන්ධයෙන් අදාලත්වයක් නැතැයි තර්ක කිරීම වැනි ය. [28]

මෙය දුබල ලෙස තෝරා ගත් උපමාවකි. ස්ටැලින්වාදයේ මාක්ස්වාදී විරුද්ධ පාර්ශ්වය එනම් ට්‍රොට්ස්කිවාදීන් ක්‍රෙම්ලිනය, සමාජවාදී ව්‍යාපාරයේ වතිකානුව ලෙස නොදිටී ය. මගේ මතකය නිවැරදි නම් ස්ටැලින් ධර්මතාවේ නොවරදිනසුලු භාවය හතර වන ජාත්‍යන්තරය විසින් නම් කවර කලෙකවත් විශ්වාසයට ගෙන නොතිබුන ද ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ වාම සුලුධනේශ්වර හා රැඩිකල් විරුද්ධවාදීන් බොහොමයක් පිලිබඳව නම් එසේ කිව නොහැකි ය.

සංශයවාදීන් සතුටුකිරීම ලෙහෙසි කටයුත්තක් නො වේ. ස්ටැලින්වාදයේ අපරාධ සම්බන්ධයෙන් මාක්ස්වාදය වගකීම දුරිය නොයුතුයි කියා සිතුවත් සෝවියට් සංගමය දිය කර හැරීම විප්ලවකාරී සමාජවාදී ව්‍යාපෘතියේ අසාර්ථකත්වයට දෙස් නොදේ දැයි ඔවුහු අසති. මෙම ප්‍රශ්නය හුවා දක්වන්නේ 1. පලල් ඓතිහාසික ඉදිරි දර්ශනයක් 2. සෝවියට් සමාජයේ ජයග්‍රහන හා ප්‍රතිවිරෝධයන් ගැන අවබෝධය හා 3. රුසියන් විප්ලවය දිග හැරුනු ජාත්‍යන්තර දේශපාලන සන්දර්භය පිලිබඳ පැසුනු න්‍යායික වැටහීමක් නොමැති කමයි.

රුසියානු විප්ලවයම ධනවාදයේ සිට සමාජවාදය කරා සංක්‍රමනයේ එක් සිද්ධි දාමයක් පමනක් විය. එවන් විශාල ඓතිහාසික ක්‍රියාවලියක් හැදෑරීම සඳහා නිශ්චිත කාල සටහන අපට ඇගවුම් කලා වූ කවර පූර්වාදර්ශයන් අප සතුවේ ද? සමාජ හා දේශපාලන කලබැගෑනි සමග එකට බැඳුනු; ආකෘතිකව වැඩවසම් කෘෂිකාර්මික සංවිධානයක සිට කාර්මික ධනේශ්වර සමාජයක් කරා වූ සංක්‍රමනය සියවස් ගනනාවක් පුරා පැතිර යයි; එනමුත් ආර්ථික, තාක්ෂනික හා සමාජ අන්තර් සම්බන්ධතාවන් සහිත නූතන ලෝකයේ ගතිකය, ධනවාදයේ සිට සමාජවාදය කරා සංක්‍රමනය ට එවන් දිග්ගැසුනු කාල පරාසයක් අවශ්‍ය නොවනු ඇත. අති මූලික, සංකීර්න හා දුරදිගයන සමාජ හා ආර්ථික ක්‍රියාවලීන් විශ්ලේෂනය සඳහා වඩාත් ගතානුගතික වූ සිද්ධීන් අධ්‍යයනය සඳහා යොදා ගත හැකිවාට වඩා සැලකිය යුතු තරම් දිගු කාල පරාසයක් ඉල්ලා සිටියි.

ඒ දක්වා හෝ සෝසසසං ආයුකාලය නොවැදගත් නො වීය. 1917 බොල්ෂෙවිකයන් බලය අල්ලාගන්නා විට, නව තන්ත්‍රය මාසයකට වත් ඔරොත්තු දේ යයි අපේක්ෂා කලේ රුසියාවෙන් බැහැර නිරීක්ෂකයන් අතලොස්සක් දෙනෙකි. ඔක්තෝබර් විප්ලවයෙන් පැන නැංගා වූ රාජ්‍යය සියවසකින් හතරෙන් තුනකට ආසන්න හැත්තෑ හතර වසරක් පැවතුනි. එම කාල පරාසය තුල දී පාලන තන්ත්‍රය දරුනු දේශපාලන පිරිහීමකට බඳුන් විය. එහෙත් 1991 දෙසැම්බරයේ දී ගොර්බචෙව් හා යෙල්ට්සින් විසින් සෝවියට් සංගමය බිඳ විසුරුවීමෙන් කුලුගැන්වුනු එම පරිහානියෙන්, 1917 ඔක්තෝබරයේ දී ලෙනින් හා ට්‍රොට්ස්කි විසින් බලය අල්ලා ගැනීම නිස්කාරන හා අර්ථ විරහිත ව්‍යාපෘතියක් වූ බව කිසිසේත් ම අදහස් නො වේ.

සෝවියට් ඉතිහාසයේ අවසන් කාල පරිච්ඡේදය බොල්ෂෙවිකයන් බලය අල්ලා ගැනීමේ ප්‍රතිඵලය වී යයි, අවශ්‍ය සම්බන්ධීකරන ක්‍රියාවලියකින් තොරව හා ඍජු ලෙස නිගමනය කිරීම චදිඑ යදඳ ැරටද චරදචඑැර යදඳ (මෙයින් පසු, මේ හේතුව නිසා) යන තර්කාන්විත විතර්කයේ ආන්තික නිදසුනක් වෙයි. සිද්ධීන් ඉතා පහසුවෙන් එකට ඇමිනීමකට සෝසසසං ඉතිහාසය පිලිබඳ වෛෂයික හා අව්‍යාජ අධ්‍යයනයකින් ඉඩක් නො ලැබෙයි. සෝවියට් ඉතිහාසයේ ප්‍රතිඵලය පූර්වයෙන් නිර්නය වී නොතිබුනි. මෙම සතිය තුල දී අප විස්තර කරන පරිදි, සෝවියට් සමූහාන්ඩුවේ වර්ධනය, වෙනත් මේ සා ඛේදනීය නොවූ දිශාවක් ගත හැකිව තිබුනි. එනමුදු, ඓතිහාසිකව උරුම කොට ගත් රුසියාවේ පසුගාමිත්වයෙන්ද, හුදෙකලා කම්කරු රාජ්‍යය අධිරාජ්‍යවාදයේ වැටලීමට හසුව තිබීමේ කාරනයෙන් ද, පැන නැංවූ වෛෂයික පීඩනයන් ද, සෝවියට් තන්ත්‍රය පරිහානිගත වීමේ දූවැන්ත ක්‍රියා කලාපයක් ඉටු කලා වූ ආත්මීය ස්වභාවයේ සාධකයන් ද, එනම් එහි දේශපාලන නායකත්වයේ වැරදීම් හා අපරාධ, සෝසසසං අවසන් බිඳවැටීම කෙරෙහි මහත් සේ බලපෑවේ ය.

කෙසේ වුවත්, රුසියානු විප්ලවය හා ඉන් පසු කාලීන යෝධ නාටකය, සෝවියට් සංගමය 1991 දී අභාවයට පත්වීම මගින් ඉතිහාසයේ නොවැදගත් තැනක් කරා දියකර හැරියේ නැත. සහතිකවම විසිවැනි සියවසේ ශ්‍රේෂ්ඨතම සිද්ධිය වූ එය, ලෝක ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම සිද්ධීන් අතරින් ද එකකි. සෝවියට් සංගමයේ ඉමහත් සමාජ ජයග්‍රහන පිලිගැනීම මගින් ස්ටැලින්වාදය කෙරෙහි අපගේ විරුද්ධත්වය තුනී වී නොයයි. නිලධාරි තනත්‍රයේ දූෂ් කලමනාකරනය හා අපරාධ තිබිය දී ම ඔක්තෝබර් විප්ලවය, සෝවියට් ජනතාවගේ ආර්ථික සහ සමාජ ජීවිතය තුල, ප්‍රගාඪ වූ ප්‍රගතිශීලී ප්‍රවනතාවන් ද, අත්‍යසාමාන්‍ය නිර්මානශීලිත්වයන් ද මුදාහලේ ය.

විප්ලවයේ ප්‍රතිඵල වසයෙන් අතිවිශාල හා පසුගාමී රුසියාව, මානව ඉතිහාසයේ පෙර නුවූ විරූ ආර්ථික, සමාජ, හා සංස්කෘතික පරිවර්තනයක් ලබා ගත්තේ ය. සෝවියට් සංගමය සමාජවාදී සමාජයක් නොවූ බව අප අවධාරනය කරන්නා වූ සැලසුම්කරනයේ මට්ටම අසම්පූර්න ස්වභාවයක පැවතුනි. ඔක්තෝබර් විප්ලවයට ආවේශය සැපයූ ජාත්‍යන්තර ඉදිරි දර්ශනය මුලුමනින්ම ප්‍රතික්ෂේප කිරීමක් නියෝජනය කලා වූ ද මාක්ස්වාදී න්‍යාය තුල මොනම පදනමක් හෝ නොමැති ව්‍යාපෘතියක් වූ ද තනි රටක් තුල සමාජවාදය ගොඩනැගීමේ ක්‍රියාමාර්ගයට 1924 දී ස්ටැලින් හා බුකාරින් විසින් මුල්ගල තැබූහ. කම්කරු පන්ති විප්ලවයේ පදනම මත පිහිටුවා ලූ සෝවියට් සංගමය තවමත් නව සමාජ සැකැස්මක උපත නියෝජනය කලේ ය. ජනසතු කල කර්මාන්තයේ එහි විභවය පැහැදිලිව පෙන්නුම් කලේ ය. එහි මධ්‍යම ආසියානු සමූහාන්ඩු පසෙක තැබුවහොත්, සෝවියට් සංගමයට රුසියානු පසුගාමිත්වයේ උරුමයෙන් ගැලවී ගත නොහැකි වුවද එහි විද්‍යාවේ, අධ්‍යාපනයේ හා සමාජ සුබසාධනයේ ද කලාවේ ද ඉදිරි වර්ධනය සැබෑ හා සැලකිය යුතු තරම් ය. ස්ටැලින්වාදී තන්ත්‍රය පිලිබඳ විවේචනශීලී වූ වාමාංශයට පවා, මාක්ස්වාදී - ට්‍රොට්ස්කිවාදීන් ස්ටැලින්වාදයේ විනාශකාරී ඇඟවීම්

පිලිබඳව කල අනතුරු ඇඟවීම් ඇදහිය නොහැක්කා සේ පෙනී ගියේ නම් ඒ සෝවියට් සමාජය ලබා ගත් ජයග්‍රහන සැලකියයුතු තරම් වීම නිසා ය.

අවසන් වශයෙන් ද සුවිශේෂීව ද ඔක්තෝබර් විප්ලවයේ ස්වභාවය හා එහි වැදගත්කම අවබෝධ කරගත හැක්කේ එය පැන නැංගාවූ ගෝලීය දේශපාලන සංදර්භය තුල තැබීමෙන් පමනකි. ඔක්තෝබර් විප්ලවය යම් වර්ගයක මුලාවක් වූයේ නම්, සමස්තයක් ලෙස 20වැනි සියවස සම්බන්ධයෙන්ම කිව යුත්තේ ද එයයි. බොල්ෂෙවිකයන් බලය අල්ලාගැනීම, 20 වැනි සියවස මුල යුරෝපීය හා ජාත්‍යන්තර ධනවාදයේ වඩා ගැඹුරු ප්‍රවාහයන් හා ප්‍රතිවිරෝධයන් තුල සැලකියයුතු පදනමකින් තොර වූ අවශ්‍යයෙන් ම අවස්ථාවාදී ස්වභාවයක් ගත්තේ ය යන්න වටහාගත හැකි පරිදි ප්‍රකාශ කරන්නේ නම් පමනක් ම, ඔක්තෝබර් විප්ලවයේ නීති යුක්ත භාවය ප්‍රතික්ෂේප කල හැකි ය;

එහෙත්, ප්‍රථම ලෝක යුද්ධය, රුසියන් විප්ලවයට හා බොල්ෂෙවිකයන්ට බලය අල්ලා ගැනීම සඳහා පසුබිම සම්පාදනය කලේ ය යන කාරනය මගින් මෙම ප්‍රකාශය නිෂේධනය කෙරේ. සිද්ධීන් දෙක නොවෙන් කල හැකි සේ එකට බැඳී තිබුනේ, යුද්ධය සාර් තන්ත්‍රය දුබලකර විප්ලවය සඳහා කොන්දේසි සකස්කලේ ය යන හුදු අවබෝධය නිසා පමනක් නොවේ. ඔක්තෝබර් විප්ලවය, යුද්ධයම පැනනංවනු ලැබූ ජාත්‍යන්තර ධනවාදී පර්යායේ ගැඹුරු අර්බුදය වඩා ප්‍රගාඪ තලයක දී වෙනස් ආකාරයකින් ප්‍රකාශිත වීමකි. යටින් ගිනියම් වෙමින් තිබුනු ලෝක අධිරාජ්‍යවාදයේ පරස්පරවිරෝධයන්, ජාත්‍යන්තර ආර්ථිකය හා ධනේශ්වර ජාතික රාජ්‍ය පද්ධතිය අතර ගැටුම, 1914 අගෝස්තුවේ දී පුපුරන සුලු ලක්ෂ්‍යයක් කරා ගෙනයනු ලැබිනි. යුද පෙරමුනේදී දෙවසරකටත් වැඩි කලක් තිස්සේ නොවිසඳිය හැකිව තිබූ ලේ වැකි ව්‍යසනයේ එම ප්‍රතිවිරෝධයන්ම රුසියන් විප්ලවයේ සමාජ පිපිරීම යටින් පැවතියේ ය. ධනේශ්වර යුරෝපයේ නායකයන්, ලෝක ධනවාදයේ විනාශයට විසඳුම් සෙව්වේ එක් ආකාරයකට ය. කම්කරු පන්තික විප්ලවවාදී නායකයන් එනම්, බොල්ෂෙවිකයන් එම විනාශයෙන්ම ගොඩයාමේ මගක් සෙවීමට උත්සාහ කලේ වෙනත් ආකාරයකට ය.

රුසියන් විප්ලවය හා ලෝක සංග්‍රාමය අතර පැවති ගැඹුරු සම්බන්ධතාවයේ ප්‍රගාඪ දේශපාලන ඇඟවීම් අවබෝධ කරගත් උගතුන් විසින්, සරයේවෝහි දී සිදුවූ ෆ්‍රාන්ස් ෆර්ඩිනැන්ඩ් ආදිපාදවරයාගේ ඝාතනය මගින් මුදා හැරුනු අර්බුදය විසඳාගත හැකිව තිබූ වෙනත් මාධ්‍යයන් ද පැවති නිසා 1914 අගෝස්තුවේ දී යුද්ධය පුපුරායාමේ අනිවාර්යතාවක් නොපැවති බව පෙන්වාදීම සඳහා, ප්‍රථම ලෝක සංග්‍රාමයේ අහඹු හා අනිශ්චිත පැති අවධාරනය කිරීමට නොයෙක් උත්සාහයන් දරනු ලැබී ය. එම තර්කයන්ට ප්‍රතිචාර වසයෙන් කරුනු දෙකක් ඉදිරිපත් කල යුතු ය.

ප්‍රථමයෙන්ම, අනෙකුත් විකල්ප විසඳුම් තිබියදීම, ඔස්ට්‍රෝ හංගේරියානු රුසියානු ජර්මානු, ප්‍රන්ස හා අවසානයේ මහා බ්‍රිතාන්‍ය ආන්ඩුව විසින් ඉතා කල්පනාකාරීව හා සිතාමතාම තෝරාගනු ලැබූයේ යුද්ධයේ මාවත යි. මෙම සියලු බලවතුන් යුද්ධයට කැමැත්ත දක්වූහ යි සැලකීමේ ප්‍රශ්නයක් නොතිබුනද, අවසානයේ දී ඔවුන් සියලුදෙනාම එක් හෝ තවත් මූලෝපායාත්මක අවශ්‍යතාවක් පරදුවට තැබිය යුතු සාකච්ඡාමය විසඳුමක් වෙනුවට, යුද්ධය තෝරා ගත්හ. විනාශ වූ මිනිස් ජීවිත සංඛ්‍යාව මිලියන ගනනක් දක්වා ඉහල නැග තිබිය දී පවා ධනපති යුරෝපීය නායකයන් යුද්ධය ගෙනගියහ. ප්‍රථමයෙන් රුසියාවේත් පසුව ජර්මනියේත් පැනනැගුනු විප්ලවයන්, යුද්ධය අවසන් කිරීමට බලකලාවූ පන්ති සම්බන්ධතාවන්ගේ වෙනසක් ඇති කරන තෙක් ම, යුදවැදුනු බලවතුන් අතර සාමය ස්ථාපිත කිරීමට බැරෑරුම් සාකච්ඡාවක් ගෙනගියේ නැත.

දෙවැනි කාරනය වූයේ කම්කරු පන්තියේ සමාජවාදී නායකයන් විසින් විනශකාරී ලෝක සංග්‍රාමයක් පැනනැගීම කලකට පෙර තියා ම දැක තිබීම යි. 1880 තරම් ඈත දී එංගල්ස් ධනේශ්වර කාර්මික බලවතුන්ගේ ගැටුමක තතු යටතේ යුරෝපයෙන් වැඩි කොටසක් සුන්බුන් බවට පත් කරන්නා වූ යුද්ධයක් පිලිබඳව අනතුරු ඇඟවී ය. 1888 දී ඇඩොල්ෆ් සර්ගේ වෙත ලිවූ එංගල්ස් යුද්ධයක "අර්ථයවන්නේ තිස් අවුරුදු යුද්ධයට සමාන විනාශයක් බව" යයි සඳහන් කලේ ය. "එය සතු යෝධ මිලිටරි ශක්තිය තිබිය දීත් යුද්ධය ඉක්මනින් අවසන් නොවනු ඇත. අභ්‍යන්තර වෙනසක් සිදු නොවී යුද්ධය අවසානය තෙක් ම ගෙන ගිය හොත් ඇතිවන අනාථ භාවය පසුගිය දෙසිය වසර තුල යුරෝපය අත්විඳි කිසිවකට සමාන වනු ද නැත." [29]

වසරකට පසුව 1899 දී, ලෆාර්ග්ට ලිවූ එංගල්ස්, යුද්ධයෙන් සිදුවිය හැකි බිහිසුනුම දේ....එයට යොදාගනු ඇති මිලියන 10-15 අතර සටන්කරුවන් නඩත්තු කිරීම පමනක් වුවත් අසමාන ලෙස විනාශකාරී ය.. අපගේ ව්‍යාපාරය මත ලෝක පරිමාන හා බලහත්කාරී මර්දනයක්, සියලු රටවල ස්වෝත්තමවාදයේ යලි පැනනැගීමක් හා 1815 පසු තිබුනාට වඩා දසගුනයකින් වැඩි බෙලහීනත්වයක්, ඒ වන විට සුදුමැලි වනතෙක් ලේ ගලා ගිය සියලු මිනිසුන්ගේ හිස්බව මත පදනම් වූ ප්‍රතිගාමීත්වයේ කාල පරිච්ඡේදයක්, ඒ අතර ම කටුක යුද්ධයේ ප්‍රතිඵලය වසයෙන් විප්ලවය හටගැනීම කෙරෙහි ඇත්තේ මඳ බලාපොරොත්තුවක් පමනක් වීම මේ සියල්ල මා සන්ත්‍රාසයෙන් පුරවාලයි"[30] යනුවෙන් සඳහන් කලේ ය.

ඊලඟ 25 වසර තුල යුරෝපයේ සමාජවාදී ව්‍යාපාරය එහි දේශපාලන උද්ඝෝෂනයේ හරි මැද තැබුවේ ධනේශ්වර හා අධිරාජ්‍යවාදී මිලිටරිවාදයට එරෙහි අරගලයයි. ධනවාදය, අධිරාජ්‍යවාදය හා මිලිටරිවාදය අතර ඇති අත්‍යාවශ්‍ය සම්බන්ධතාවය ගැන සමාජවාදී ව්‍යාපාරයේ දක්ෂතම න්‍යායාචාර්යවරුන් කල විශ්ලේෂනයන් ද, අධිරාජ්‍යවාදී යුද්ධය මුලුමනින්ම පාහේ නෙවැලැක්විය හැකි බවට ඔවුන් කල අනතුරු ඇඟවීම් ද, 1914 අගෝස්තු සිද්ධීන් අහම්බයන් යයි ද, ලෝක ධනේශ්වර පර්යායේ ගැලවී යා නොහැකි ප්‍රතිවිරෝධයන්ට අසම්බන්ධිත යයි ද, පලවු ප්‍රකාශයන් නිෂ්ප්‍රභ කරයි.

ප්‍රථම ලෝක සංග්‍රාමය ඇවිලීයාමට දහඅට මසකට අඩු කාලයකට පෙර, 1913 මාර්තුවේ දී බෝල්කන්හි අර්බුදයේ ඇඟවීම් ගැන පහත සඳහන් විශ්ලේෂනය කරනු ලැබී ය. "බෝල්කන් යුද්ධය බෝල්කන් ප්‍රදේශයේ පැරනි දේශසීමා විනාශකර තිබුනා පමනක් නොව බෝල්කන් රාජ්‍ය අතර අන්‍යොන්‍ය වෛරය හා ඊර්ශ්‍යාවේ ගින්න දල්වනු ලැබුවා පමනක් ද නොව, යුරෝපයේ ධනපති රාජ්‍යයන් අතර සමතුලිතතාවය ද, දිගුකලකට බිඳදමනු ලබනවා ඇත." "දැනටමත් බෙහෙවින් අස්ථාවර වී ඇති යුරෝපීය සමතුලිතතාවය දැන් මුලුමනින් ම කැලඹීමට පත්ව තිබේ. යුරෝපයේ ඉරනම භාරව සිටින්නවුන් මේ වතාවේ දී කරුනු කාරනා එහි සීමාව කරා ම ගෙන යමින් සමස්ත යුරෝපියානු යුද්ධයක් ඇරඹීමට තීරනය කරනු ඇත්දැයි යන්න පෙර දැකීමට අපහසු ය."[31]

මෙම වැකිවල කතුවරයා ලියොන් ට්‍රොට්ස්කි ය.

ප්‍රථම ලෝක සංග්‍රාමයේ බලාපොරොත්තු රහිත හා අහඹු ස්වභාවය සංකල්පනය කරනු ලැබූ ධනවාදයේ ක්ෂමාලාපක උගතුන් මහා අවපාතය, ෆැසිස්ට්වාදයේ නැගීම මෙන්ම දෙවැනි ලෝක යුද්ධය ඇවිලීයාම ද වැනි, 20වැනි සියවසේ ධනේශ්වර ඉතිහාසයේ සෑම අප්‍රසන්න සිදුවීමක ම අහම්භ ස්වභාවය ගැන නිගමනය කරති. ඒ සියල්ල, වැරදි නිගමනයන්, පෙර නොදැකිය හැකි වූ අහම්බයන් හා ඇත්තට ම විවිධාකාර නරක පුද්ගලයන් පිලිබඳ කාරනයකි. ෆ්‍රැන්සිස් ෆූරෙට් නම් ප්‍රන්ස ඉතිහාසඥයා අපට කියා ඇති පරිදි "අපගේ කාලය පිලිබඳව සැබෑ අවබෝධයක් ලැබියහැක්කේ අප, අවශ්‍යතාවේ මායාවෙන් අපව ම නිදහස් කරගත හොත් පමනකි. 20 වැනි සියවස පැහැදිලි කලහැකි එකම මාර්ගය, එක්තරා දුරකට හෝ පැහැදිලි කිරීමක් කල හැක්කේ එහි පූර්ව කථනය නොකලහැකි ස්වභාවය අවධාරනය කිරීමෙනි. 20 වැනි සියවසේ ඉතිහාසය ද 18 හා 19 වැනි සියවස්වල මෙන්ම, වෙනත් මගක් ගත හැකිව තිබුනි. අපට අවශ්‍යවන්නේ එය, ලෙනින්, හිට්ලර්, හෝ ස්ටැලින් නොමැතිව සංකල්පනය කිරීම යි." ඔහු ප්‍රකාශ කරයි. [32]

එවැනි ම උද්ධච්චකමකින් යේල් විශ්වවිද්‍යාලයේ කනිෂ්ඨ මහාචාර්ය හෙන්රි ඇෂ්ලි ටර්නර්, සම්පූර්න පොතක් ම කැප කර ඇත්තේ හිට්ලර් බලයට පත්වීම බොහෝකොට ම අහම්බයන්ගේ ප්‍රතිඵලයක් බව පෙන්වාදීමට යි. ලෝක යුද්ධය වර්සේල්ස් සාම ගිවිසුම හා ලෝක අවපාතය වැනි අවාසනාවන්ත සිද්ධීන් කිහිපයක් ගැන සඳහන් නොකල ද ජර්මන් ඉතිහාසයේ දිග්ගැසුනු නිශ්චිත ගැටලු පැවතුනි. එහෙත් වඩාත්ම වැදගත් වන "වාසනාව - අහම්බයන්ගේ වඩාත්ම පෙර නොදැකිය හැකි දෙය පැහැදිලිව ම හිට්ලර්ගේ පැත්තෙහි ය." [33] "පෞද්ගලික හිතවත්කම් ද නොමනාපකම් ද සිත්තැවුල් ද මිතුරුකම් පලුදුවීම් හා පලිගැනීමේ ආශාව ද" යන මේ සියල්ල ද එක්ව කල්තබා කිව නොහැකි ආකාරයෙන් ජර්මානු දේශපාලනයට බලපා ඇත. එමෙන් ම "පැපේන් හා බැරන් වොන් ෆර්ඩර් අතර මහත්වරුන්ගේ සමාජශාලාවෙහි අහම්බ හමුවක්ද තිබුනි" එය ද අවසානයේ දී හිට්ලර්ගේ වාසියට සිදුවිය. [34]

යමෙක් මවිතකරවනः "වොන් පැපේන් මහත්වරුන්ගේ සමාජශාලාවට යෑම වෙනුවට සෙම්ප්‍රතිශ්‍යාව වැලඳී ඇඳෙහි පසුවුනා නම් පමනක් 20 වැනි සියවසේ මුලු ගමන්මග ම වෙනස් කල හැකිව තිබුනි. ඒ සමානව සිදුවිය හැක්කේ නූතන භෞතික විද්‍යාවේ සමස්ත වර්ධනයම අපට හිමි වී ඇත්තේ නිව්ටන්ගේ හිසමතට අහම්බයෙන් මෙන් කඩා වැටුනු එම උත්කෘෂ්ඨ ඇපල් ගෙඩියට පින් සිදුවන්නට ය. ඉතිහාසය හුදෙක් "මෝඩයකු විසින් මහත් හඬින් ද කෝපයෙන් ද කියන ලද වැදගැම්මකට නැති කතාවක් " නම් එය ඉගෙනීමේ අර්ථය කුමක් ද? මනුෂ්‍ය වර්ගයාට ව්‍යසනකාරී තර්ජනයක් එල්ල කල, අප ජීවත් වන ලෝකයේ ඇති මෙම ගැටලු විසඳාලීමට නම්, 20වැනි සියවස පිලිබඳව විඩාවට පත් කරන කරුනුමය දැනුම පමනක් නොව, පසුගිය වසර 100ය තුල කම්කරු පන්තිය පසුකර තිබෙන බොහෝ ඛේදජනක සිද්ධීන්වල පාඩම් ගැඹුරින් උකහා ගැනීම ද අවශ්‍යවන බව මෙම සතියේ දේශනවල දී ඇති කර ගත් එකඟතාව යි.

2000 වසර කරා එලඹීමේ දී පසුකර යන සියවස හැදෑරීම වෙනුවෙන් කැපකල වෙලුම් විශාල සංඛ්‍යාවක් පොත් වෙලඳපොලට නිකුත් කර තිබේ. මෙම කාල පරිච්ඡේදය අංගලක්ෂනය කෙරෙන, සැලකිය යුතු ජනප්‍රියත්වයක් අත්කරගත් "කෙටි විසිවන සියවස" ඉන් එකකි. සියවස අර්ථගැන්වූ අංගලක්ෂනයන් 1914 ලෝක සංග්‍රාමය ඇවිලී යාමත් සමග ආරම්භ වී, 1991 සෝසසසං අභාවයට පත්වීමත් සමග අවසන් වූ බවට තර්ක කරන එරික් හොබ්ස්බෝම් විසින් විශේෂයෙන් ම එයට අනුබලය දැක්වී ය. හොබ්ස්බෝම්ගේ අභිමතාර්ථයන් කුමක් වුවත්, මෙම ප්‍රවිෂ්ටය ඓතිහාසික නීතියේ ප්‍රකාශනයක් වනවාට වඩා 20 වන සියවසේ තීරනාත්මක සිද්ධීන් යථාර්ථයෙන් බැහැර වූ ප්‍රන්ස කලා සම්ප්‍රදාය

වැනි යයි තර්ක කල අයට සහාය දීමේ නැඹුරුවක් පෙන්වයි.

මෙම අර්ථකථනය ප්‍රතික්ෂේප කරන, මා සිතන්නේ "අසම්පූර්න වූ සියවස" යන්න මෙම වකවානුව වඩා හොඳින් අංගලක්ෂිත කරන බවයි. ඓතිහාසික කාලවාචකයේ දෘෂ්ටි ආස්ථානයෙන් නිසැකව ම 20 වන සියවස එහි ගමන්මග දුවගොස් හමාර වී තිබේ. එය හමාර ය. එහෙත්, 1901-2000 අතර කාලයේ මහා සමාජ අරගල හා කැලඹීම්වලට යටින් වැටී ඇති මූලික හා විශාල ගැටලුවල ආස්ථානයෙන් නම් විසඳී ඇත්තේ අල්පයකි.

20වැනි සියවස නොගෙවූ දැවැන්ත ඓතිහාසික බිලක් 21 වැනි සියවසට ඉතිරි කර තිබේ. යුද්ධය, ෆැසිස්ට්වාදය හා මානව ශිෂ්ඨාචාරය වඳ වී යෑමේ හැකියාව පවා අඩංගු කර ගත් කම්කරු පන්තිය පසු ගිය සියවස තුල පොරබැදූ සියලු සන්ත්‍රාසයන් අද අප වෙත පැමින තිබේ. අන්තරායන් හා උභතෝකෝටිකයන්, මානව ගති ලක්ෂනයේ එම ස්වභාවය තුල ම ගැබ් ව පවතින්නේ යැයි කියනු ලබන සාන්දෘෂ්ටිකවාදීන් මෙන් අප කථා නො කරන්නෙමු. නැත, අප කටයුතු කරමින් සිටින්නේ ධනේශ්වර නිෂ්පාදන විධියේ අත්‍යාවශ්‍ය පරස්පරවිරෝධයත් සමග ය. ඒවා සංවර්ධනය වී ආ මුල්ම යුගයේ දී ඒ හා සමග පොරබැදූ 20 වන සියවසේ ශ්‍රේෂ්ඨතම විප්ලවවාදී මාක්ස්වාදීන් වන ලෙනින්, ලක්සම්බර්ග් හා ට්‍රොට්ස්කි කල ආකාරයට ය. පසුගිය සියවස තුල විසඳිය නොහැකි වූ දේ මෙම සියවස තුල විසඳිය යුතු ය. නැත හොත් මෙම සියවස මානව වර්ගයාගේ අවසන් සියවස වීමේ අති විශාල හා සැබෑ අන්තරායක් පවතියි.

20 වන සියවසේ ඉතිහාසය හැදෑරීමත් එහි පාඩම් උකහා ගැනීමත් ජීවිතයත් මරනයත් අතර කාරනයක් වන්නේ එම නිසා ය.

**සමාප්තයි.**

**සටහන්:**


[28] ටර්නර්, preface to *Karl Marx and Max Weber*, (කාල් මාක්ස් සහ මැක්ස් වෙබර් කෘතියේ පෙරවදන) 5 පි .

[29] කාල් මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස්, *Collected Works*, Volume 48 (එකතු කල කෘති 48 වෙලුම), 139 පි.

[30] එම, 283 පි.

[31] ලියොන් ට්‍රොට්ස්කි, *The Balkan Wars 1912-13* (බෝල්කන් යුද්ධ 1912-13), (නිව් යෝර්ක් 1980) 314 පි.

[32] *The Passing of an Illusion: The Idea of Communism in the Twentieth Century* (මිථ්‍යාවක අවසානයඃ විසි වන සියවසේ කොමියුනිස්ට්වාදය පිලිබඳ අදහස) (චිකාගෝ 1999) 2 පි.

[33] *Hitler's Thirty Days to Power*, (හිට්ලර් බලය කරා ගිය තිස් දවස) ඇඩිසන් වෙස්ලි 1996, 168 පි.

[34] එම.